# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/249/2025 (PSC)

ඊ.එන්.එච්.එදිරිසිංහ,

**අභියාචක**

**එදිරිව**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය :-2026.03.26**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක සිටී,
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක, ආනන්ද ආරියවංශ මහතා,
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම්, කේ.ටී.මදුරංගි මිය.

අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක ආනන්ද ආරියවංශ මහතා පහත සඳහන් කරුණු ඉදිරිපත් කරයි.

"අභියාචක විසින් මෙම පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත නැවත සේවය ලබා ගැනීම සඳහා අභියාචනයක් ඉදිරිපත් කර ඇත. එම අභියාචනය ඉදිරිපත් කර ඇත්තේ, සමෘද්ධි අධ්‍යක්ෂක ජනරාල්තුමා විසින් අභියාචක සේවයෙන් පහකරන ලද විනය නියෝගයට එරෙහිවය. ඒ අනුව මෙම අභියාචනය අද දින ගරු විනිශ්චය අධිකාරය ඉදිරියේ විභාගයට ගන්නා ලද අවස්ථාවේ දී අභියාචකගේ පූර්ව සේවා කාලය සළකා බලා, ඇයට විශ්‍රාම වැටුපක් ලබා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කිරීමට ඇති අයිතිවාසිකම රඳවා තබා ගනිමින්, මෙම අභියාචනය ඉල්ලා අස්කර ගැනීමට අවසර ඉල්ලා සිටිමි. එසේම, අභියාචක වෙනුවෙන් මෙම ඉල්ලීම කරනු ලබන්නේ, අභියාචක දැනට අවුරුදු 55 සම්පූර්ණ කර ඇති නිසා බවට වැඩි දුරටත් දන්වා සිටිමි"

## -නියෝගය-

ඉහත ඉල්ලීම සළකා බලා, අභියාචක වෙනුවෙන් කරුණු දක්වමින්, මෙම අභියාචනය ඉල්ලා අස්කර ගැනීමට කරන ලද ඉල්ලීමට අවසර දෙමි. ඇයගේ විශ්‍රාම වැටුප ලබා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අයිතිවාසිකම ඇය වෙත රඳවා තබමින්, මෙම අභියාචනය නිශ්ප්‍රභ කරමු.

ඉහත කොන්දේසි වලට යටත්ව අභියාචනය නිශ්ප්‍රභ කරමු.

අභියාචනය නිශ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-